# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,123 - 2019 මැයි මස 10 වැනි සිකුරාදා - 2019.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු ... ... ... | 988 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | 991 |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 993 |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2019 මැයි මස 31 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2019 මැයි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති

2019 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

### තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ:-

| අනු. අංකය | තනතුර | තනතුරු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|
| 01 | සෞඛ්‍ය කම්කරු<br>III වන ශ්‍රේණිය | 02 | PL1-2016<br>රු. 24,250-10x250-10x270-10x300-12x330 - රු. 36,410 | 8 වන ශ්‍රේණිය (09 වසර) සමත්ව තිබීම. |

02. *බඳවා ගැනීමේ කොන්දේසි* :

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
2. අයදුම්කරුවන් මනා මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක් බෙලිඅත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවන් විය යුතුය.
4. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් දකුණු පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවයේ නියුක්ත වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)
5. බඳවා ගැනීමේ පටිපාටිය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයකට යොමු කරන අතර, එහිදී ලබා ගන්නා ඉහලම ලකුණු අනුව සුදුස්සන් තෝරා ගැනේ.
6. දැනටමත් බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ එම තනතුරුවල අනියම්, ආදේශක, කොන්ත්‍රාත් හෝ දෛනික පදනම යටතේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලබන අතර, ඔවුන් ආයතන ප්‍රධානියා මගින් තම අයදුම් පත ඉදිරිපත් කළ යුතුය.
7. තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීතිවලටද, පළාත්පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටද, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව පනවනු ලැබ ඇති හා වරින් වර පනවනු ලබන නීතිරීතිවලටද යටත් විය යුතුය.
8. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සපුරා තිබිය යුතුය.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* ඃ-

(i) මෙම තනතුර ස්ථිරය , විශ්‍රාම වැටුප් සහිතය.

(ii) වැන්දඹු / පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

(iii) බඳවා ගනු ලබන අය වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. එම කාලය තුළදී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදයක වේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

(iv) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව භාෂා ප්‍රවීනතාව ලබා ගත යුතුය.

(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.

04. තනතුර සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්ෂේත්‍ර සහ ලකුණු ප්‍රමාණයන් :

| | | | |
|---|---|---|---|
| * | අධ්‍යාපන සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = 30 |
| * | අමතර සුදුසුකම් | උපරිම ලකුණු ප්‍රමාණය | = 10 |
| * | පළපුරුද්ද | උපරිම ලකුණු ප්‍රමාණය | = 10 |
| * | සභා බල ප්‍රදේශයේ පදිංචිය (වසරකට ලකුණු 5 බැගින්) | උපරිම ලකුණු ප්‍රමාණය | = 45 |
| * | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | උපරිම ලකුණු ප්‍රමාණය | = 05 |
| | | එකතුව | 100 |

(තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය 50% )

05. අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කළ යුතුය.

- උප්පැන්න සහතිකය;
- ජාතික හැඳුනුම්පත;
- අධ්‍යාපන සහතික, ඉහලම අධ්‍යාපන සුදුසුකම් දක්වෙන සහතික;
- තම පදිංචිය සහතික කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය;
- මෑතකදී ලබාගන්නා ලද චරිත සහතික දෙකක්;
- සේවා පළපුරුද්ද පිළිබඳ සහතික;
- වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

(මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්පත් පමණක් පරීක්ෂණය සඳහා කැඳවීම කරනු ලැබේ.)

06. *අයදුම්පත් ඉදිරිපත් කරන ආකාරය* :

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රයට අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙල කරන ලද අයදුම්පත් 2019.05.24 දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "සභාපති, බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව, බෙලිඅත්ත" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් කරන තනතුර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ සඳහන් කළ යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුරේදී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලතල බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ සභාපති සතුය.

සිරිල් මුණසිංහ,
සභාපති,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව.

2019 ක් වූ අප්‍රේල් මස 23 වැනි දින,
බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව,
බෙලිඅත්ත.

**ආදර්ශ අයදුම් පත්‍රය**

බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව

**........................................................ තනතුරට බඳවා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :————————————.
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————————.
3. ස්ථිර ලිපිනය : ————————————.
4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————————————.
5. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.

6. උපන් දිනය : වර්ෂය :—————— මාසය :—————— දිනය :——————

7. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : මාස : දින :

8. විවාහක / අවිවාහක බව :——————————————.

9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක්ද? යන වග :——————————————.

10. ඔබ සාපරාධී වරදක් සම්බන්ධව උසාවියකින් වරදකරුවකු වී තිබේද ? :——————————————.

11. අධ්‍යාපන සුදුසුකම් :——————————————.

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :——————————————.

13. ඔබ දැනට බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවයේ නියුතු නම්:——————————————.

    1. දැනට දරන තනතුර :——————————————.
    2. එම තනතුරට පත් වූ දිනය :——————————————.
    3. එම පත්වීමේ ස්වභාවය : (ස්ථිර/ ආදේශක /අනියම්/ කොන්ත්‍රාත් / දෛනික පදනම මතද යන වග)

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දක්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද දනිමි.

.........................................

දිනය :................................. අයදුම්කරුගේ අත්සන.

## ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ආයතනයේ ................................. ලෙස සේවය කරනු ලබන .................................... මයා / මිය / මෙනවිය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු කාර්යාලීය ලිපි ලේඛන අනුව නිවැරදි වේ. මෙම තනතුරට තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය සේවයෙන් නිදහස් කළ හැක. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන:.................................

නම:.................................

තනතුර:.................................

දිනය :.................................

05-99

# පළාත් පාලන නිවේදන

## කෑගල්ල ප්‍රාදේශීය සභාව

1975 අංක 04 දරන වීථි නම් කිරීම සහ ස්මාරක පිහිටුවීම පාලනය කිරීමට අදාළ පනත හා සබරගමුව පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 1999/1 (නීති) හා 1999 මාර්තු 28 දිනැති චක්‍රලේඛයට අනුව කටයුතු කර 2018.07.19 දින මහා සභා තීරණ අංක 18/07/ඉ-8 යටතේ ගන්නා ලද තීරණය ප්‍රකාරව 1174/21 අංක දරන 2001.03.09 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ අංක 231 යටතේ ප්‍රකාශයට පත් කර ඇති කෑගල්ල ප්‍රාදේශීය සභාවේ ලියාපදිංචි මාර්ගයක් වන කොළඹ නුවර පාරේ සිට නියදගල දක්වා වන ගම්සභා පාර සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති CLG 5/5/2/2-4 හා 2019.02.01 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ ලිපිය අනුව මින් ඉදිරියට බී. එස්. සේනානායක මාවත නමින් නම් කරන බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අයි. ජගත් රවීන්ද්‍ර ජයසිංහ,
සභාපති,
කෑගල්ල ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 2 වැනි දින.

05-85

---

## 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

## වැල්වෙට්ටිතුරයි නගර සභාව

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව වැල්වෙට්ටිතුරයි නගර සභාව විසින් 2018/09/12 වන දින වැල්වෙට්ටිතුරයි නගර සභාව පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කෝණලිංගම් කරුණානන්දරාසා,
සභාපති,
වැල්වෙට්ටිතුරයි නගර සභාව.

2019 අප්‍රේල් මස 12 වන දින,
වැල්වෙට්ටිතුරයි,
වැල්වෙට්ටිතුරයි නගර සභාවේ දී ය.

### 2018.09.12 වන දින අංක 236 දරන තීරණය

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ පළාත්පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2018/05/09 වන දින අංක 2070/11 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබූ උතුරු පළාතේ පළාත් සභාව විසින් 2018/09/11 වන දින ස්ථිර කරන ලද 2018/10/08 වන දින අංක 2092/6 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්ද වූ ද නගර සභාව සම්මත අතුරු ව්‍යවස්ථා අංක 07 සිට 09 දක්වා වූ කොටස්වල දක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථාවේ තීරණය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ වැල්වෙට්ටිතුරයි නගර සභාව තීරණය කරන්නීය."

05-166

## යටිනුවර ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්ති යටතේ කරනු ලබන දැන්වීමයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2018 දෙසැම්බර් මස 28 දින අංක 2,104 දරන පළාත් සභා *ගැසට් පත්‍රය* මගින් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත.

ඉහත *ගැසට් පත්‍රය* මගින් ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාළ ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පර්ශ්වයන් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, එම ගැසට් නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට දැනුම් දී ඇත.

එහෙත් එම කාල සීමාව තුළ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්තිය ප්‍රකාර ක්‍රියාකර නොමැති බැවින්, එකී *ගැසට්* නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇති පරිදි මෙහි පහත උපලේඛනයේ සඳහන් මංමාවත් යටිනුවර ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ආර්. එන්. කේ. රූපස්සර,
සභාපති,
යටිනුවර ප්‍රාදේශීය සභාව.

යටිනුවර ප්‍රාදේශීය සභාව,
ඇඹිල්මීගම,
පිළිමතලාව.

| *අනු. අංකය* | *මාර්ගයේ නම* | *ග්‍රාම නිලධාරි වසම* | *පටන් ගන්නා ස්ථානය* | *අවසන්වන ස්ථානය* | *වම් පැත්ත* | *දකුණු පැත්ත* | *දිග මීටර්* | *පළල මීටර්* | *පිඹුරු පත් අංකය* |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | වීරසිංහ මාවත | අරඹේගම බටහිර | කොට-කුඹුර පාරේ සිට | තලව්දෙනිය වත්ත | යූ. ආර්. නන්දාවතී රාජපක්ෂ<br>යූ. ආර්. ජයවර්ධන<br>යූ. ආර්. සුභරත්න<br>එන්. රන්දුනුගේ | එම්. අයි. එම්. මුක්තාර්<br>ජී. කේ. ජී. චන්ද්‍රලතා<br>කේ. බී. මල්කාන්ති ද සිල්වා<br>ජේ. කේ. බී. කිරින්දෙනිය<br>කේ.බී. මල්කාන්ති ද සිල්වා | මීටර් 200 | මීටර් 2.43 | 3702 |

05-237

## බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව

1975 අංක 04 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත

**දාවුදුකන්ද "ආසිරි පෙදෙස" නමින් නම් කිරීම**

2015.03.17 (2015 මාර්තු) වැනි දින බොපේ පෝද්දල ප්‍රාදේශීය සභාවේ පැවැති මහ සභා රැස්වීමේ දී තීරණ අංක 05:01:03 දරන සභා සම්මුතියට අනුව වීථි නාමය වෙනස් කිරීම පහත සඳහන් පරිදි තීරණය කරන ලදී. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය යටතේ සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව හා 1975 අංක 4 දරන වීථි නම් කිරීම ස්මාරක ඉදිකිරීම හා පාලනය කිරීමේ පනත යටතේ විධිවිධාන පරිදි දකුණු පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් ලබාදෙන ලද 2019.02.25 දිනැති අනුමැතිය ප්‍රකාරව පහත සඳහන් උපලේඛනයේ විස්තර කර ඇති මාවත "ආසිරි පෙදෙස" යනුවෙන් නම් කරනු ලැබ ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

දිල්රුක් එන්. අබේකෝන්,
සභාපති,
බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව.

2019 මාර්තු
බෝපෙ-පෝද්දල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛන*

| | | |
|---|---|---|
| පළාත් පාලන ආයතනයේ නම | - | බෝපේ පෝද්දල ප්‍රාදේශීය සභාව |
| දිස්ත්‍රික්කය | - | ගාල්ල |
| ග්‍රාම සේවක කොට්ඨාසය | - | 124C , කහදූව වත්ත |
| වීථියේ වර්තමාන නම | - | දාවුදුකන්ද පටුමග |
| අලුතින් යොදා ඇති නම | - | ආසිරි පෙදෙස |
| මාර්ග විස්තරය | - | වරිපනම් අංක 125/C වලින් ආරම්භ වී වී125/17 න් අවසන් වන දිග මීටර් 392 හා මීටර් 05 පළලින් යුතු දාවුදුකන්ද පටුමග නමින් හැඳින්වෙන මාර්ගය |

05-87

---

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## වාරියපොල ප්‍රාදේශීය සභාව

ප්‍රාදේශීය සභා රීති 216 ප්‍රකාරව වාර්ෂික මූල්‍ය වාර්තාව ප්‍රකාශයට පත්කිරීම

වාරියපොළ ප්‍රාදේශීය සභාවේ 2018.12.31 දිනට අදාළ මූල්‍ය වාර්තාව (ශේෂ පත්‍රය) මහජනතාවගේ දැනගැනීම සඳහා ප්‍රකාශයට පත් කිරීමට මවිසින් තීරණය කළ බව මෙයින් නිවේදනය කරමි.

ඩී. එම්. ටී. බී. දිසානායක,
සභාපති,
වාරිපොළ ප්‍රාදේශීය සභාව.

2019 අප්‍රේල් මස 22 වැනි දින,
වාරියපොළ ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ය.

එහි ශේෂ පත්‍රය පහත පරිදිය.

**2018.12.31 වැනි දිනට ශේෂ පත්‍රය (රු.)**

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

| | 2018 | | 2017 | |
|---|---|---|---|---|
| *ස්ථාවර වත්කම් (සටහන 01)* | | 411,503,598.83 | | 405,580,999.75 |
| *ජංගම වත්කම්* | | | | |
| අතැති තොග *(සටහන 02)* | 4,126,497.24 | | 2,986,287.44 | |
| උපයෝගී සේවා සඳහා ණය *(සටහන 03)* | 2,661,971.80 | | 2,368,937.80 | |
| සේවක ණය | 9,977,176.15 | | 8,274,796.58 | |
| අයකර ගත හැකි උපයෝගී සේවා *(සටහන 04)* | 0.00 | | 0.00 | |
| ආදායම් ණය ගැතියෝ *(සටහන 05)* | 173,757,402.72 | | 224,414,735.77 | |
| පෙර ගෙවුම් *(සටහන 06)* | 83,231.25 | | 179,889.38 | |
| ආයෝජන *(සටහන 07)* | 112,722,698.40 | | 101,796,522.17 | |
| මුදල් *(සටහන 08)* | 14,485,766.04 | | 20,651,639.79 | |
| ජංගම වත්කම් එකතුව | 317,814,743.60 | | 360,672,808.93 | |
| අඩුකළා - ජංගම වගකීම් | | | | |
| ණය හිමියෝ *(සටහන 09)* | 163,219,335.50 | | 211,860,413.70 | |
| කලින් ලැබීම් *(සටහන 10)* | 162,039.85 | | 178,338.58 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු *(සටහන 11)* | 6,161,230.85 | | 7,941,764.15 | |
| ජංගම වගකීම් එකතුව | 169,542,606.20 | | 219,980,516.43 | |
| කාරක ප්‍රාග්ධනය/ඍණ කාරක ප්‍රාග්ධනය (2-3) | 148,272,137.40 | 148,272,137.40 | 140,692,292.50 | 140,692,292.50 |
| ශුද්ධ වත්කම් | | 559,775,736.23 | | 546,273,292.25 |
| මුදල් යොදවන්නේ | | | | |
| සමුච්චිත අරමුදල හා සංචිත *(සටහන 12)* | 551,801,328.03 | | 536,340,627.50 | |
| ණය ප්‍රාග්ධනය (සටහන 13) | 7,974,408.20 | | 9,932,664.75 | |
| එකතුව | | 559,775,736.23 | | 546,273,292.25 |

**2018.12.31 වැනි දිනට ශේෂ පත්‍රය (රු.)**

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

*සටහන් 01*

| | | | *2018.12.31 පිරිවැය* | *2017.12.31 පිරිවැය* |
|---|---|---|---|---|
| 110. | *ස්ථාවර වත්කම්* | | | |
| | 111. | ඉඩම් හා ගොඩනැගිලි | 295,606,734.47 | 293,137,694.97 |
| | 112. | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 5,024,674.99 | 3,808,742.60 |
| | 113. | මෝටර් රථ හා කරත්ත | 720,733.46 | 75,608,515.65 |
| | 114. | ලී බඩු සවිකිරීම් | 13,997,789.69 | 10,610,507.55 |
| | 115. | පුස්තකාල පොත් | 13,407,546.89 | 12,198,029.69 |
| | 116. | කාර්යාල උපකරණ | 11,393,506.79 | 10,217,509.29 |
| | | **එකතුව** | **411,503,598.83** | **405,580,999.75** |

| | | 2018.12.31 පිරිවැය | 2017.12.31 පිරිවැය |
|---|---|---|---|
| *සටහන් 02* | | | |
| 120. අතැති තොග | | | |
| 121. | පොදු ගබඩාව | 853,681.26 | 617,493.83 |
| 122. | ලිපි ද්‍රව්‍ය ගබඩාව | 937,391.18 | 443,446.61 |
| 123. | කොන්ක්‍රීට් අමුද්‍රව්‍ය ගබඩාව | 199,250.00 | 245,250.00 |
| 124. | කොන්ක්‍රීට් නිම්තොග | 1,050,912.80 | 589,222.00 |
| 125. | කර්මාන්ත ගබඩාව | 1,085,262.00 | 1,090,885.00 |
| | **එකතුව** | **4,126,497.24** | **2,986,287.44** |
| *සටහන් 03* | | | |
| 130. උපයෝගී සේවා සඳහා ණය | | | |
| 131. | බ්ලොක් ගල් ව්‍යාපෘතිය | 2,603,754.00 | 2,310,720.00 |
| 132. | ආධාර නිවාස ජලාපවාහන | 58,217.80 | 58,217.80 |
| 133. | ජරාවාස ගොඩනැගිලි නඩත්තුව | | |
| 134. | පුද්ගලික වීථිවල ජලනල යෙදීම | | |
| | **එකතුව** | **2,661,971.80** | **2,368,937.80** |
| *සටහන 04* | | | |
| 150. අයකරගතහැකි උපයෝගී සේවා | | | |
| 151. | අයකිරීමට තිබෙන වැඩ | | |
| 152. | තොගය සඳහා උපකරණ තැනීම් | | |
| 153. | විවිධ | | |
| | **එකතුව** | | |
| *සටහන් 05* | | | |
| 160. ආදායම් ණය ගැතියෝ | | | |
| 161. | හිඟ හිටි වරිපනම් | 478,682.96 | 413,730.70 |
| 162. | හිඟ හිටි අක්කර බදු | 114,518.68 | 141,090.67 |
| 163. | හිඟ හිටි ව්‍යාපාර බදු | 6,000.00 | |
| 164. | හිඟ හිටි කුලී ආදායම් ගිණුම | 21,465.00 | 1,900.00 |
| 165. | හිඟ හිටි සේවා සඳහා ගාස්තු | 224,400.00 | 89,250.00 |
| 166. | හිඟ හිටි වරෙන්තු ගාස්තු හා දඩ මුදල් | 3,258,518.00 | 2,183,900.00 |
| 167. | හිඟ හිටි වෙනත් ආද ායම් | 26,679,609.00 | 20,147,800.00 |
| 168. | හිඟ හිටි ආ දායම් ආධාර | 7,651,943.17 | 15,135,783.38 |
| 169. | හිඟ හිටි ප්‍රාග්ධන ආදායම් | 135,230,015.91 | 186,137,031.02 |
| 170. | නඩු ගිණුමෙහි ශේෂය | 92,250.00 | 164,250.00 |
| | **එකතුව** | **173,757,402.72** | **224,414,735.77** |
| *සටහන් 06* | | | |
| 170. පෙර ගෙවුම් | | | |
| 171. | සභාව විසින් තැන්පත් | | |
| 172. | අත්තිකාරම් සාමාන්‍ය | | |
| 173. | අගරු චෙක්පත් | 83,231.25 | 179,889.38 |
| | **එකතුව** | **83,231.25** | **179,889.38** |

| | | 2018.12.31 පිරිවැය | 2017.12.31 පිරිවැය |
|---|---|---|---|
| *සටහන් 07* | | | |
| 180. ස්ථාවර තැන්පත් | | | |
| 181. | ස්ථාවර තැන්පත්වල ඇති සහාවේ මුදල් | 112,248,037.57 | 101,358,165.81 |
| 182. | සේවක ඇප ආයෝජන | 474,660.83 | 438,356.36 |
| 183. | නිදන් අරමුදල් | | |
| 184. | වෙනත් | | |
| | **එකතුව** | **112,722,698.40** | **101,796,522.17** |
| *සටහන් 08* | | | |
| 190. මුදල් | | | |
| 191. | ජල ව්‍යාපෘති ගිණුම | 936,242.25 | 743,525.80 |
| 192. | 615 ගිණුම | 0.00 | 500.00 |
| 193. | 612 ගිණුම (සාමාන්‍ය) | 11,574,014.99 | 15,885,244.92 |
| 194. | 614 ගිණුම (කර්මාන්ත) | 1,821,977.65 | 3,228,557.56 |
| 195. | මුදල් ගිණුම (සේවක ණය) | 153,531.15 | 793,811.51 |
| | **එකතුව** | **14,485,766.04** | **20,651,639.79** |
| *සටහන් 09* | | | |
| 230. ණය හිමියෝ | | | |
| 231. | වියදම් ණය හිමියෝ (සාමාන්‍ය) | 1,626,281.29 | 1,859,396.16 |
| 232. | ණය හිමියෝ (කර්මාන්ත) | 157,148,964.39 | 205,277,409.41 |
| 233. | සැපයුම් ණය හිමියෝ | 1,000,392.50 | 1,487,127.95 |
| 234. | විදුලිය සැපයුම් ණය හිමියෝ | | |
| 235. | නොගෙවූ වැටුප් හා වේතන | 419,919.36 | 212,702.22 |
| 236. | වෙනත් (ගෙවිය යුතු විශ්‍රාම වැටුප්) | 3,023,777.96 | 3,023,777.96 |
| | **එකතුව** | **163,219,335.50** | **211,860,413.70** |
| *සටහන් 10* | | | |
| 240. කලින් ලැබීම් | | | |
| 241. | කලින් ලද ආදායම් | 162,039.85 | 178,338.58 |
| 242. | අවිනිශ්චිත ගිණුම | | |
| | **එකතුව** | **162,039,85** | **178,338,58** |
| *සටහන් 11* | | | |
| 250. | ආපසු ගෙවිය යුතු තැන්පතු | | |
| 251. | සේවක ඇප තැන්පත් | 474,660.83 | 436,356.36 |
| 252. | ජාතිය ගොඩනැගීමේ බදු | 66,353.14 | |
| 253. | ටෙන්ඩර් තැන්පත් | 2,256,137.98 | 2,617,696.25 |
| 254. | ගිවිසුම් ඇප (ආරක්ෂිත) | 1,128,728.70 | 916,300.00 |
| 255. | පුස්තකාල තැන්පත් | 666,613.75 | 623,391.75 |
| 256. | ගෙවල් කුලී තැන්පත් | 0.00 | 25,741.16 |
| 257. | විවිධ තැන්පත් | 263,602.53 | 402,676.26 |

| | | 2018.12.31 පිරිවැය | 2017.12.31 පිරිවැය |
|---|---|---|---|
| 258. | පරිසර තැන්පත් | 99,625.00 | 92,000.00 |
| 259. | ප්‍රජා ශාලා තැන්පත් | 176,570.75 | 111,000.00 |
| 260. | ගොඩනැගිලි පරීක්ෂණ තැන්පත් | 77,000.00 | 627,607.00 |
| 261. | මුද්දර බදු තැන්පත් | 121,529.75 | 169,325.15 |
| 262. | නළ ළිං නඩත්තු තැන්පත් | 250,166.30 | 100,988.00 |
| 263. | පෙර පාසල් තැන්පත් | 0.00 | 460,050.00 |
| 264. | ජල ව්‍යාපෘති තැන්පත් | 152,291.32 | 152,291.32 |
| 265. | වීරීරේබා තැන්පත් | 139,500.00 | 469,000.00 |
| 266. | ගලි බවුසර් තැන්පත් | 164,750.00 | 91,625.00 |
| 267. | පිඹුරු පරීක්ෂණ තැන්පත් | 83,000.00 | 292,750.00 |
| 268. | කර්මාන්ත තැන්පත් | 34,000.00 | 345,683.40 |
| 269. | සේවක ණය ඉදිරි ලැබීම් | 6,701.55 | 7,282.50 |
| | **එකතුව** | **6,161,230.85** | **7,941,764.15** |

*සටහන් 12*

210. සමුච්චිත අරමුදල් හා සංචිත

| | | | |
|---|---|---|---|
| 211. | සමුච්චිත අරමුදල | 140,297,729.20 | 130,759,627.75 |
| 212. | ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම | 411,503,598.83 | 405,580,999.75 |
| | **එකතුව** | **551,801,328.03** | **536,340,627.50** |

*සටහන් 13*

220. ණය ප්‍රාග්ධනය

| | | | |
|---|---|---|---|
| 221. | දේශීය ණය සංවර්ධන අරමුදල | 7,974,408.20 | 9,932,664.75 |
| | **එකතුව** | **7,974,408.20** | **9,932,664.75** |

05-130